# දේශාභිමානී



## ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත නිලධාරියෙකු ලෙස [කෙටිකාලීන පාඨමාලාව යටතේ] සේවයට එක්වීමට

# ඔබටත් අවස්ථාවක්

### මූලික සුදුසුකම්

- පුරවැසිභාවය : ශ්‍රී ලාංකික පිරිමි පුරවැසියෙකු විය යුතුය.
- වයස : 2024 අගෝස්තු මස 30 වන දිනට වයස අවුරුදු 18 ත් 24 ත් අතර විය යුතුය.
- උස : අඩි 5 යි අඟල් 6 ට (167.5 cm) නොඅඩු විය යුතුය.
- බර : කි.ග්‍රෑ. 52 (රාත්තල් 118) ට නොඅඩු විය යුතුය.
- පපුව : අඟල් 32 ට නොඅඩු විය යුතුය.
- දෘෂ්ටි තීක්ෂණතාවය : 6/6 (උපැස් සහ කාච රහිතව).
- ශරීර ස්කන්ධ දර්ශකය : 18.5 Kg/m² - 25 Kg/m² ත් අතර විය යුතුය.
- විවාහක/අවිවාහක බව : අවිවාහක විය යුතුය.

### අධ්‍යාපන සුදුසුකම්

- අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී එකවර විෂයයන් තුනක් (03) සමත්වීම (සාමාන්‍ය සාමාර්ථ), සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ක ලකුණු ප්‍රතිශතයක් ලබා තිබීම

සහ

- අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී එකවර විෂයන් පහකට (05) සම්මාන සාමාර්ථ සමග විෂයන් අටක් (08) සමත්වීම (විද්‍යාව විෂය ඇතුළුව) හා තෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි, ගණිතය හා සිංහල/දෙමළ විෂයන් සඳහා සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම. ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) පමණක් ලබා ඇති අයදුම්කරුවන් අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ NVQ Level - 4 මට්ටමේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන ආයතනයක් මගින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඩිප්ලෝමා/උපාධි පාඨමාලාවක් හදාරා තිබීම (NVQ සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතුය)

හෝ

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) විභාග වලට සමාන ජාත්‍යන්තර විභාගයකින් (Pearson Edexcel, GCSE, GCE හා Cambridge හෝ වෙනත්) ඒ හා සමාන සාමාර්ථ ලබා තිබිය යුතුය (ඉහත අනිවාර්යය විෂයයන් ද ඇතුළුව).

### වෙනත් සුදුසුකම්

- ජාත්‍යන්තර/ජාතික මට්ටමින් ක්‍රීඩා, නායකත්ව, වෙනත් ජයග්‍රහණ සහ වෙනත් භාෂා (සිංහල හා ඉංග්‍රීසි හැර) හැසිරවීම විශේෂ සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.

### වැටුප් හා දීමනා සහ අනෙකුත් ප්‍රතිලාභ

- පුහුණු කාලසීමාව සඳහා කෙඩෙට් නිලධාරීන් හට ආහාර සහ අනෙකුත් දීමනා ද ඇතුළත්ව මාසික දළ වැටුප රු. 91,551.80.
- කෙඩෙට් නිලධාරීන් හට ප්‍රවාහන, නිල ඇඳුම්, වෛද්‍ය ප්‍රතිකාර සහ නවාතැන් පහසුකම් නොමිලේ සපයනු ලැබේ.
- පාඨමාලාව සාර්ථකව අවසන් කරනු ලබන කෙඩෙට් නිලධාරීන් දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කරනු ලැබේ.
- එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා මෙහෙයුම්, විදේශීය යුද්ධ හමුදා විද්‍යාපීඨයන්හි පුහුණුවීම්/සංචාර සහ උසස් විදේශ පාඨමාලා හැදෑරීමේ අවස්ථාවන්ද හිමිවේ.



නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු අතර, යුද්ධ හමුදා වෙබ් පිටුව වෙත පිවිසීමෙන් අයදුම්පත බාගත කළ හැක.

විමසීම් :
0112 514 605

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය :
2024 ජූලි 10

සියළුම විස්තර හා අයදුම්පත් :
www.army.lk/officers

**පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය**
යුද්ධ හමුදා මූලස්ථානය
ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.